# ඒරාවූර් නගර සභාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 21 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.36,000 ක්වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සභාව සතු මහජන පුස්තකාලයේ පොත් 1400 ක්, 2010 වර්ෂයේදී සිදුවූ ගංවතුර හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී තිබුණද, ඒවා පොත්වලින් ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා ගිණුම් ප්‍රකාශ වල වත්කම්වල අගය වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ කාන්තා පොල කඩ බදු කුලිය වන රු.150,510 ක මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මහජන පොලෙහි කඩ කාමර 40 ක බදුකරුවන්ගෙන් 2008 සිට 2013 වර්ෂය දක්වා හිඟව තිබූ රු.2,897,460 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයකර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මස් කඩ සඳහා වූ වාර්ෂික බලපත්‍ර ගාස්තු ප්‍රමාණය සම්පූර්ණයෙන්ම එම වර්ෂයේදීම ගෙවා නිම නොකළ තුන් දෙනෙකුට දිගටම වර්ෂ 05 ක් බලපත්‍ර ලබාදීම නිසා 2010 සිට 2013 දක්වාවූ වර්ෂවල අයකළ යුතු රු.344,429 ක හිඟ බදු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එක් සිනමා ශාලාවකින් 2010 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ හිඟ විනෝද බදු වන රු.204,945 ක මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.181,871 ක ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2014 අගෝස්තු 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඊ) නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා ලබාදී තිබූ රු.3,446,050 ක අත්තිකාරම් මුදල, අයකර ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතු නොකර වර්ෂ දහයක සිට දිගටම ගිණුම් ප්‍රකාශවල දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
---------------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 85,177,866 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 3,348,826 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන |
| මෝටර් වාහන | 2,342,888 | |
| ලිබඩු සවිකිරීම් | 2,167,358 | |
| පරිගණක | 157,050 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත (අධිකාරය 255) | |
| (i) 40 වගන්තිය | ගව ඝාතකාගාරයන් අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රියා මාර්ගය අනුගමනය නොකර රු.564,512 ක් සඳහා කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| (ii) 177(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල සාරාංශය මහජනයාගේ දැන ගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කිරීමට සභාව විසින් 2014 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| (iii) 180(1) වගන්තිය | එක් එක් ගිණුම් වර්ෂය සඳහා සභාවේ සභාපති විසින් විස්තරාත්මක වාර්ෂික පාලන වාර්තාව පිළියෙල කර තිබිය යුතුය. කෙසේ වුවද එවැනි වාර්තාවක් සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර නොතිබුණි. |

(iv) 227(1) වගන්තිය

නගර සභාවේ මන්ත්‍රීවරුන්, නිලධාරීන් සහ සේවකයින් සෘජුවම හෝ වක්‍රව සභාවේ කොන්ත්‍රාත් වැඩ වලට සම්බන්ධ නොවිය යුතුයි. මෙයට පටහැනිව සභාවේ මන්ත්‍රීවරයෙකු සාමාන්‍යාධිකාරී වශයෙන් කටයුතු කරන විවිධ සේවා සමුපකාර සමිතියකට සමාලෝචිත වර්ෂයේදී බහාලුම් අළුත්වැඩියා කටයුතු භාරදී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,881,587 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,396,642 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 484,945 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් බදු | 2,570,312 | 1,938,592 | 631,720 | 25 |
| බදු කුලී | 1,436,420 | 1,247,340 | 189,080 | 13.2 |
| බදු | 1,366,200 | 625,300 | 740,900 | 54 |
| බලපත්‍ර ගාස්තු | 788,500 | 655,700 | 132,800 | 17 |

2.2.2 වරිපනම් හා බදු

------------------

නගර සභා ආඥා පනතේ (අධිකාරිය 255) 160 වන වගන්තිය අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද ගෙවල්, ගොඩනැගිලි වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා අයකළ යුතු එකතුව රු.8,918,457 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ උප සභාපති ගේ නිවාස දුරකථන ගාස්තු වශයෙන් තීරණය කර තිබූ මාසික ගාස්තු ප්‍රමාණය වූ රු.3,000 ඉක්මවා රු.8,307 ක් ගෙවා තිබූ නමුදු වැඩිපුර ගෙවා තිබූ මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. තවද, 2012 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු.12,446 ක මුදල වසර 2 ක් ඉක්මවා තිබුණද ඒවා අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායක මුදල මාසිකව ගෙවීම සඳහා 1995 වර්ෂයේ සිට සභාව කටයුතු කර නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු.2,777,757 ක දායක මුදලක් ගෙවීමට තිබුණි.

(ඇ) 1987 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව ආරම්භ කිරීමට ප්‍රථම නගර සභා වශයෙන් ක්‍රියාත්මක වූ කාලයේ ලංකා විදුලි බල මණ්ඩලය වෙනුවෙන් මහජනයා වෙත විදුලිය සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

1988 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා විදුලිය සැපයීම් වෙනුවෙන් පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතු රු.786,122 ක විදුලිය ගාස්තු ප්‍රමාණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 53 % සිට 75 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) ආදායම් කළමනාකරණය

(ඉ) අයවැය පාලනය